WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 16 - ඉස්ලාම්

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018 දෙසැම්බර්

## 16 - ඉස්ලාම්

## අවසාන ලකුණු ගණනය කිරීම

**I පත්‍රය**

ප්‍රශ්න ගණන 40 කි. 1x40 = 40 යි.

**II පත්‍රය**

පළමු ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි.

කොටස් 10කි. එක් කොටසකට ලකුණු 2 බැගින් ලකුණු 20 යි.

2 සිට 7 දක්වා තෝරාගත් ප්‍රශ්නවලින් ප්‍රශ්න 4කට පිළිතුරු සැපයිය යුතුය.

එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් 10x04 = 40 යි.

*** 7 වෙනි ප්‍රශ්නයෙහි කොටස් 04න් තෝරාගත් ප්‍රශ්න 2කට පිළිතුරු සැපයිය යුතුය.**

**එක් කොටසකට ලකුණු 5 බැගින් කොටස් 2ට - ලකුණු 10යි.**

**2 සිට 6 දක්වා ප්‍රශ්න කොටස් 3කින් සමන්විත වේ.**

WWW.OLEVELAPI.COM

| | | | |
|---|---|---|---|
| I. | කොටස | - | ලකුණු 02 යි. |
| II. | කොටස | - | ලකුණු 03 යි. |
| III. | කොටස | - | <u>ලකුණු 05 යි.</u> |
| | එකතුව | - | <u>ලකුණු 10 යි.</u> |
| | I පත්‍රයට | - | ලකුණු 40 යි. |
| | II පත්‍රයට | - | <u>ලකුණු 60 යි.</u> |
| | එකතුව | - | <u>ලකුණු 100 යි.</u> |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

WWW.OLEVELAPI.COM

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM


[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

2018.12.03 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ඉස්ලාම් I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අල්ලාහ්ගේ ශුද්ධ වූ නාමයන්ගෙන් 'අර් රහීම්' යන පදයේ අර්ථය
(1) 'ඉතාමත් පරිශුද්ධ වූවෙකි' යන්නයි.
(2) 'පරම ක්ෂමාශීලියකි' යන්නයි.
(3) 'අති දයාවන්ත වූවෙකි' යන්නයි.
(4) 'සියල්ල දන්නා කෙනෙකි' යන්නයි.

**2.** ඉස්ලාමීය අකීදාවට පදනම් වන අංශ
(1) අල්-කුර්ආන් සහ සුන්නා ය.
(2) ඉජ්මා සහ කියාස් ය.
(3) අල්-කුර්ආන් සහ ඉජ්මා ය.
(4) කියාස් සහ උර්ෆු ය.

**3.** බඃස්, මහ්ෂර්, හිෂාෆ්, ජන්නා වැනි පරලොව ජීවිතය හා සම්බන්ධ වූ කාරණා ඇතුළත් ක්ෂේත්‍රය
(1) අල්-ඉලා හියියාත් ය.
(2) අන්-නුබුව්වාත් ය.
(3) අස්-සම්ඉයියාත් ය.
(4) අර්-රූහානියියාත් ය.

**4.** 'වරළ' යන්නෙන් පිළිවෙත් සුරැකීම දක්වන ආකාරයට 'තක්වා' යන්නෙන් කුමක් දැක්වේ ද?
(1) පව් සමාව
(2) දේව බිය
(3) ඇල්මක් නොමැති ජීවිතය
(4) වගකීම් පැවරීම

WWW.OLEVELAPI.COM

**5.** ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) සහ අබූ මන්සූර් අල්-මාතුරුදි (රහ්) යන දෙදෙනා
(1) අකීදා කලාව පිළිබඳ විද්වතුන් වේ.
(2) හදීස් කලාව පිළිබඳ විද්වතුන් වේ.
(3) නීති කලාව පිළිබඳ විද්වතුන් වේ.
(4) තෆ්සීර් කලාව පිළිබඳ විද්වතුන් වේ.

**6.** ඉමාම් මාලික් (රහ්) ගේ සුවිශේෂ නාමය වන්නේ
(1) ඉමාමුල් ඇලම් ය.
(2) ආලිමුල් කුරෛෂ් ය.
(3) සයිෆුල්ලාහ් ය.
(4) ඉමාමුල් මදීනා ය.

**7.** නබී (සල්) සමයේ තමා නබිවරයෙක් යැයි වාද කළ පුද්ගලයා
(1) තුලෛහා ය. (2) සජා ය. (3) මුසෛලමා ය. (4) අස්වද් අන්සි ය.

**8.** 'කුත්තාබුල් වහි' යනුවෙන් හඳුන්වන්නේ
(1) අල්-කුර්ආන් වන පොත් කර ගත් අය වේ.
(2) අල්-කුර්ආනයට අර්ථ දැක්වීම කළ අය වේ.
(3) අල්-කුර්ආනය පුද්ගලිකව ලියා තැබූ අය වේ.
(4) වහි පහළ කළ විගස නබී (සල්) තුමාගේ අධීක්ෂණය යටතේ ඒවා ලියා තැබූ අය වේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

9. සුන්නත් සව්මය සිදු කිරීමට සුදුසු සතියේ දින වන්නේ
   (1) සිකුරාදා සහ සෙනසුරාදා ය.
   (2) සඳුදා සහ බ්‍රහස්පතින්දා ය.
   (3) ඉරිදා සහ සඳුදා ය.
   (4) බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ය.

10. සලාතයේ ෆර්ලුවලට ඇතුළත් **නොවන්නේ**
   (1) පළමු තක්බීර් කීම ය.
   (2) ෆාතිහා සූරාව පාරායනය කිරීම ය.
   (3) සුජූද් දෙකක් කිරීම ය.
   (4) සලාතය ඉටු කරන ස්ථානය පිරිසිදුව තබා ගැනීම ය.

11. 'අෑලුස් සුන්නා වල් ජමා අත්' යනුවෙන් හඳුන්වන්නේ
   (1) හදීස් ග්‍රන්ථ ගොනු කළ පුද්ගලයින් ය.
   (2) නබි (සල්) තුමාව සහ සහාබාවරුන්ව අනුගමනය කරන පුද්ගලයින් ය.
   (3) ඉමාම්වරුන් හතරදෙනා අනුගමනය කරන පුද්ගලයින් ය.
   (4) ඉස්ලාම් අකීදාවට විරුද්ධවන පුද්ගලයින් ය.

12. මූඃමින්වරයෙකුට නොතිබිය යුතු ගුණාංග දෙකක් නබි (සල්) තුමා සඳහන් කළේ ය. එම ගුණාංග කවරේ ද?
   (1) පොළිය සහ සූදුව
   (2) බොරුව සහ විශ්වාසවන්තබවක් නොමැතිවීම
   (3) බොරුව සහ සොරකම
   (4) මත්ද්‍රව්‍ය භාවිතය සහ විශ්වාසවන්තබවක් නොමැතිවීම

13. විශාල ජල තටාකයක ජලජ පැළෑටි වැවී තිබීම නිසා ජලයේ වර්ණය සහ රසය වෙනස් වී ඇත. මෙම ජලයේ,
   (1) වූළුඃ සිදු කළ හැකි ය.
   (2) වූළුඃ සිදු කළ නොහැකි ය.
   (3) වූළුඃ සිදු නොකිරීම යෝග්‍ය ය.
   (4) වූළුඃ සිදු කර සලාතය යැදිය හැකි ය. නමුත් පිරිසිදු ජලය ලද සැනින් නැවත වූළුඃ සිදුකොට සලාතය ඉටු කළ යුතු වේ.

14. හජ් වගකීම ඉටු කිරීමට යන කෙනෙක් හජ් පමණක් ඉටු කිරීමට නියියත් තැබුවා ය. මෙම ක්‍රියාව
   (1) අත්තම්මතුඋ යනුවෙන් හැඳින්වේ.
   (2) අල්-ඉබ්රාත් යනුවෙන් හැඳින්වේ.
   (3) අල්-කිරාන් යනුවෙන් හැඳින්වේ.
   (4) අල්-ඉත්ලාක් යනුවෙන් හැඳින්වේ.

15. සීගිරි බිතුසිතුවම් පෙන්වීමට ශිෂ්‍යයින් කැටුව ගිය ගුරුවරයා ඔවුන්ට පස්වරු පහට පමණ අසර් සමග එකතුකොට ලුහර් සලාතය ඉටු කිරීමට සැලැස්විය. මෙම ක්‍රමය
   (1) ජම්උ ලෙස හැඳින්වේ.
   (2) කස්රු ලෙස හැඳින්වේ.
   (3) ජම්උ තක්දීම් ලෙස හැඳින්වේ.
   (4) ජම්උ තෑහීර් ලෙස හැඳින්වේ.

16. මස්ජිදුල් කිබ්ලතයින් පිහිටි ස්ථානය
   (1) මක්කා ය.
   (2) තායිෆ් ය.
   (3) මදීනා ය.
   (4) ජිද්දා ය.

17. පුද්ගලයෙක් සතුව රුපියල් ලක්ෂ හතක් වර්ෂය පුරා තිබුණි. එම වර්ෂයේ සකාත්වල නිසාබ් රු. 600,000 වේ. ඔහු ගෙවිය යුතු ණය රු. 100,000 නම් වර්ෂය අවසානයේ ඔහු ගෙවිය යුතු සකාත් ප්‍රමාණය
   (1) රු. 12,000 කි.
   (2) රු. 13,000 කි.
   (3) රු. 14,000 කි.
   (4) රු. 15,000 කි.

WWW.OLEVELAPI.COM

18. අල්-කුර්ආනයේ ඇති දීර්ඝතම සූරාව
   (1) අල්-කෑෆු ය.
   (2) ආල ඉම්රාන් ය.
   (3) අල්-බකරා ය.
   (4) අල්-මුල්ක් ය.

19. ඉස්ලාම් නීති කලාවේ වර්ධනයට මෙහෙයක් ඉටු කළ ප්‍රසිද්ධ ඉමාම්වරුන් අතුරෙන් කෙනෙක් වන්නේ,
   (1) ඉමාම් ෂාෆිඊ (රහ්) ය.
   (2) ඉමාම් ගස්සාලි (රහ්) ය.
   (3) ඉමාම් ඉබ්නු කසීර් (රහ්) ය.
   (4) ඉමාම් බුහාරි (රහ්) ය.

20. මියගිය ස්වාමිපුරුෂයා වෙනුවෙන් 'ඉද්දා' ඉටු කරන කාන්තාවක් අනිවාර්යයෙන්ම වැලැකී සිටිය යුතු කරුණ වන්නේ,
   (1) විවාහ වීම ය.
   (2) රැකියාව සඳහා පිට වී යාම ය.
   (3) රූපවාහිනී නැරඹීම ය.
   (4) වෛද්‍යවරයෙක් වෙත යෑම ය.

21. "අරාබි බස සෑම මුස්ලිම්වරයෙකුගේම නිවසේ භාවිත කළ යුතු භාෂාව වන්නේ නම් මා කැමති ය." යැයි සඳහන් කළ දේශීය විද්වතා
   (1) ටී.බී. ජායා ය.
   (2) සිද්දිලෙබ්බෙ ය.
   (3) ඒ.එම්.ඒ. අසීස් ය.
   (4) සර් මාකාන් මාකාර් ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**22.** පහත X හා Y යටතේ දී ඇති තොරතුරු කිසියම් ආකාරයකින් එකිනෙකට සම්බන්ධතාවක් දක්වයි. ඒ අනුව Y තීරුවේ ඇති ඒවා, X තීරුවේ ඇති ඒවා සමග අනුපිළිවෙළින් ගළපා ඇති වරණය තෝරන්න.

| X | Y |
|---|---|
| (i) ඉබාදත් | A - අත කැපීම |
| (ii) මුආමලාත් | B - දන් දීම |
| (iii) අඛ්ලාක් | C - සකාත් |
| (iv) හුදූද් | D - හවුල් ව්‍යාපාර |

(1) A B C D (2) B C D A (3) C D B A (4) D C B A

**23.** ජනාසා සලාතයේදී තුන්වන තක්බීර්වලින් පසු පාරායන කළ යුත්තේ,
(1) සූරතුල් ෆාතිහා ය. (2) නබි (සල්) තුමාට සලවාත් කීම ය.
(3) ජනාසා වෙනුවෙන් ප්‍රාර්ථනය ය. (4) සලාම් කීම ය.

**24.** ස්නානය අනිවාර්ය වූ අවස්ථාවක පුද්ගලයෙක් ජලය භාවිතා කිරීමට නොහැකි හේතුවෙන් සලාතය නියමිත වේලාවට ඉටු කිරීම ප්‍රතික්ෂේප කරයි. ඔහුට ඔබ දෙන උපදේශය කුමක් ද?
(1) ඔබ ස්නානය කොට අනිවාර්යයෙන් සලාතය ඉටු කළ යුතු ය.
(2) ඔබ තයම්මුම් කර සලාතය ඉටු කළ යුතු ය.
(3) සලාතය ඉටු කිරීමෙන් වැළකී සිටීමට ඔබට අවසර ඇත.
(4) ඔබ සලාතයට පසුව 'කලා' කළ යුතු ය.

**25.** භාර්යාව නැවත ලබාගැනීමට අවස්ථාව සැලසෙන පරිදි සිදු කරන දික්කසාද ක්‍රමය
(1) රජ්ඊ ය. (2) බායින් ය. (3) ළිහාර් ය. (4) ඊලාඋ ය.

**26.** ආගම අනුමත කළ ගමනක් ගොස් අතරමං වූ අවස්ථාවක සකාත් ලබාගැනීමට අනුමැතිය ඇත්තේ,
(1) කාරිමූන් ය. (2) ඉබ්නු සබීල් ය. (3) ෆීසබීල් ය. (4) මුසාෆිර් ය.

**27.** සකාත්, සකාතුල් ෆිත්රා පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සකාත් ෆර්ළු, සකාතුල් ෆිත්රා සුන්නත් වේ.
(2) මේවා දෙකම රමළාන් මාසයේ ඉටු කළ යුතු ය.
(3) මේවා දෙකම එකවිට අනිවාර්ය වේ.
(4) සකාතුල් ෆිත්රා පළමුවත් ඉන්පසුව සකාත් අනිවාර්ය වේ.

**28.** විවාහයකදී 'වලි' ලෙස සිටීමට **නුසුදුස්සා**
(1) පියා ය. (2) පියාගේ පියා ය.
(3) මවගේ සහෝදරයා ය. (4) පියාගේ සහෝදරයාගේ පුතා ය.

**29.** නබි (සල්) තුමා අවසාන වශයෙන් විවාහ වූ වැන්දඹු ස්ත්‍රිය
(1) මයිමූනා (රලි) ය. (2) සෆියියා (රලි) ය. (3) සයිනබ් (රලි) ය. (4) උම්මු හබීබා (රලි) ය.

**30.** 'හයියලස්සලාහ්' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) සලාතය ආරම්භ විය. (2) සලාතය සඳහා ඉක්මණින් පැමිණෙන්න.
(3) ජයග්‍රහණ මාවතේ ඉක්මණින් පැමිණෙන්න. (4) සලාතය නින්දට වඩා යෝග්‍ය ය.

**31.** මානසික ආශාවන්ට යටත් වී පාප ක්‍රියා සිදු කරමින් සිටි ශිෂ්‍යයා, 'තස්කියතුන් නෆ්ස්' යන පාඩම ඉගෙනගත් පසු සිත් වේදනාවට පත්ව, තමාව නිවැරදි කරගැනීමට අධිෂ්ඨාන කර ගත්තේ ය. මෙසේ සිතන හදවත
(1) නෆ්සුල් මුත්ම ඉන්නා ලෙස හැඳින්වේ. (2) නෆ්සුල් ලව්වාමා ලෙස හැඳින්වේ.
(3) නෆ්සුල් අම්මාරා ලෙස හැඳින්වේ. (4) නෆ්සුන් සලීම් ලෙස හැඳින්වේ.

**32.** ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ගැන සඳහන් වන 'ෆුදූහුල් බුල්දාන්' යන ග්‍රන්ථයේ කර්තෘ
(1) ඉබ්නු ෂහ්රයාර් ය. (2) ඉබ්නු අරබි ය. (3) ඉබ්නු හිෂාම් ය. (4) බලාදූරි ය.

**33.** 'හුකූකුල් ඉබාද්' හි අඩංගු කරුණ
(1) අල්-කුර්ආන් පාරායනය කිරීම ය. (2) සුන්නත් සලාතය ඉටු කිරීම ය.
(3) පරිසරය සුරැකීම ය. (4) හදීස් පාඩම් කිරීම ය.

**34.** වැඩි වශයෙන් හදීස් දැනුම් දුන් පුද්ගලයා ලෙස හැඳින්වෙන නබිතුමාගේ සගයා
(1) අනස් (රලි) ය. (2) තල්හා (රලි) ය. (3) උමර් (රලි) ය. (4) අබූ හුරෛරා (රලි) ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**35.** 'කියාමුල්ලයිල්' යනු
(1) රමළාන් මාසයේ රාත්‍රී කාලයේ නමැදුම් ආදී ආගමික කටයුතුවල නිරත වීම ය.
(2) රමළාන් මාසයේ 27 වෙනි දින රාත්‍රියේ ආගමික කටයුතුවල නිරත වීම ය.
(3) රාත්‍රී කාලයේ ධාර්මික කටයුතුවල නිරත වීම ය.
(4) රමළාන් මාසයේ රාත්‍රී කාලයේ අවසාන භාගයේ 'විත්ර්' වැනි නමැදුම්වල නිරත වීම ය.

**36.** 'තර්තීබුන්නුසූල්' යනු
(1) අල්-කුර්ආනය පාරායනය කරන ක්‍රමයයි.
(2) අල්-කුර්ආනය ලියූ පිළිවෙළයි.
(3) අල්-කුර්ආනය පහළ වූ පිළිවෙළයි.
(4) අල්-කුර්ආනය ආරක්ෂා කළ පිළිවෙළයි.

**37.** කෙනෙක් පිළිබඳව වැරදි ප්‍රකාශ කළ කෙනෙකුට ඉස්ලාම් දෙන දඬුවම
(1) කස පහරවල් 10කි.
(2) කස පහරවල් 40කි.
(3) කස පහරවල් 60කි.
(4) කස පහරවල් 80කි.

**38.** ඉස්ලාම් දහම ඉගැන්වීම සඳහා ශ්‍රී ලංකාවට එවූ ධර්ම දේශකයා
(1) කාලිද් ඉබ්නු බකායා ය.
(2) ඔරාබි පාෂා ය.
(3) ඉබ්නු බතූතා ය.
(4) වහබ් ඉබ්නු අබී හෆ්සා ය.

**39.** නජිස් සහිත ඇඳුම් රෙදි සෝදන යන්ත්‍රයේ සෝදන විට සැලකිය යුතු ප්‍රධාන කරුණ වන්නේ
(1) හොඳින් සේදීමයි.
(2) සුවඳවත් සබන් භාවිත කිරීමයි.
(3) තුන් වතාවක් සේදීමයි.
(4) රෙදි සෝදන යන්ත්‍රයෙන් එළියට ගත් ඇඳුම් එකිනෙක එක් වතාවක් හෝ ජලය ගලායන පරිදි සේදීමයි.

**40.** 'මුහාසබා' යන්නෙන් හැඳින්වෙන්නේ
(1) ස්වයං විමසීම ය.
(2) චිත්ත පාරිශුද්ධභාවය ය.
(3) දේව තෘප්තිය ය.
(4) ඉවසීම අනුගමනය කිරීම ය.

* *

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

| විෂයය අංකය<br>பாட இலக்கம் | 16 | විෂයය<br>பாடம் | இஸ்லாம் |
|---|---|---|---|

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 03 | 11. | 02 | 21. | 02 | 31. | 02 |
| 02. | 01 | 12. | 02 | 22. | 03 | 32. | 04 |
| 03. | 03 | 13. | 01 | 23. | 03 | 33. | 03 |
| 04. | 02 | 14. | 02 | 24. | 02 | 34. | 04 |
| 05. | 01 | 15. | 04 | 25. | 01 | 35. | 03 |
| 06. | 04 | 16. | 03 | 26. | 02 | 36. | 03 |
| 07. | 03, 04 | 17. | 04 | 27. | 04 | 37. | 04 |
| 08. | 04 | 18. | 03 | 28. | 03 | 38. | 01 |
| 09. | 02 | 19. | 01 | 29. | 01 | 39. | 04 |
| 10. | 04 | 20. | 01 | 30. | 02 | 40. | 01 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25/40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25/40 |
|---|---|---|---|



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# ඉස්ලාම් II

## I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

(i) **නබි ඉබ්රාහීම් (අලෛ) ගින්නට වීසි කළ විට ඔහු කියූ වැකිය මොනවා ද?**

හස්බියල්ලාහු වනිඃමල් වකීල්

(ii) **ජාහිලියියා සමයේ තිබූ වෙළඳපොළවල් දෙකක් නම් කරන්න.**

උක්කාල්, මිජන්නා, දූල් මජාස්

*(මෙයින් ඕනෑම 2 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි)*

(iii) **තාවකාලික මහ්රම්වරුන්ට උදාහරණ දෙකක් සපයන්න.**

- බිරිඳගේ සහෝදරිය
- බිරිඳගේ මවගේ සහෝදරිය
- බිරිඳගේ පියාගේ සහෝදරිය
- ඉද්දා සිටින කාන්තාව
- ඉහ්රාම් ඇඳ සිටින කාන්තාව
- තවත් කෙනෙකුගේ බිරිඳ
- ගණිකාව
- මුෂ්රික් වූ කාන්තාව

*(මෙයින් ඕනෑම 2 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි)*

(iv) **අර්කානුල් කියාස් සඳහන් කරන්න.**

අස්ල්, ෆරඋ, ඉල්ලත්, හුක්ම්

*(ලකුණු ½ x 4 = 02 යි)*

(v) **සමාජ සංහිදියාව ඇති වීමට ඉස්ලාම් පෙන්වා දුන් මාර්ග දෙකක් ලියන්න.**

- මිනිසුන් වශයෙන් උදවු උපකාර කිරීම.
- සහෝදර ජනතාව / ජාතීන් සමග ස්නේහයෙන් කටයුතු කිරීම.
- පෞද්ගලික ආගමික හා ජාතිවාදී මානසිකත්වයෙන් මිදීම.
- අන්‍ය ආගම්වලට නොබැනීම.
- අන්‍ය සමාජ සංස්කෘතියට ගරු කිරීම.
- අවංකව හා නීතිගරුකව කටයුතු කිරීම.

*(මෙවැනි ඕනෑම කරුණු 2 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(vi) **තව්බා පිළිගැනීමට හේතු වන කොන්දේසි දෙකක් සඳහන් කරන්න.**

- පිරිසිදු චේතනාව.
- තමා කළ පාප අතහැර එයින් සහමුලින් ම ඉවත් වීම.
- (පෙර කළ ඒ) පාපය නැවතත් නොකරන බවට ප්‍රතිඥා දීම.
- කරන ලද පාපය මිනිසා හා සම්බන්ධ වන්නේ නම් ඔහුගෙන් සමාව ඉල්ලා සිටීම.

*(මෙයින් ඕනෑම කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි)*

(vii) **ව්‍යාපාරික භාණ්ඩවල තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.**

- විකුණුම්කරුට භාණ්ඩය අයිති විය යුතුය.
- ගැනුම්කරුට භාණ්ඩය භාර දිය හැකි තත්ත්වයක තිබිය යුතුය.
- අත්පිට තිබිය යුතුය.
- ඉස්ලාමීය ෂරීආවට අනුව පිරිසිදු හා ප්‍රයෝජනවත් භාණ්ඩයක් විය යුතුය.

*(මෙයින් ඕනෑම කරුණු 2 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි)*

(viii) **ඉස්ලාම්, ස්ත්‍රීන්ට ලබා දී ඇති අයිතීන් දෙකක් සඳහන් කරන්න.**

- ජීවත් වීමේ අයිතිය
- අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය
- තම සහකරු තෝරා ගැනීමේ අයිතිය
- දේපොළ උරුමය
- අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය
- රැකියාවක යෙදීමේ අයිතිය
- දික්කසාද වීමේ අයිතිය

*(මෙයින් ඕනෑම කරුණු 2 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි)*

(ix) **උපවාසයෙහි ෆර්ලු දෙකක් සටහන් කරන්න.**

WWW.OLEVELAPI.COM

- නියියත් තැබීම
- අරුණෝදයේ සිට හිරුබැස යනතුරු උපවාසය බිඳෙන කරුණු වලින් වැළකී සිටීම.

*(මෙම කරුණු දෙක ලියා ඇත්නම් ලකුණු 02 යි)*

(x) **ළමයින් දෙමව්පියන්ට ඉටු කළ යුතු වගකීම් දෙකක් සඳහන් කරන්න.**

- දෙමව්පියන්ට ආදරය කිරීම.
- දෙමව්පියන්ට අවනත වීම.
- ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම.
- ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම.

*(මෙවැනි කරුණු 2 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි)*

*(2 x 10 = 20)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

02.

(i) **"ඊමාන් මුෆස්සල් " යනු කුමක්ද?**

විස්තරාත්මක ඊමාන් *(ලකුණු 01 යි)*

ඊමාන් කළ යුතු අංග හය විශ්වාස කර පිළිගැනීම *(ලකුණු 01 යි)*

*(1 + 1 = 02 යි)*

(ii) **ෂිර්ක් අක්බර්හි වර්ග දෙකක් නිදසුන් සහිතව දක්වන්න.**

- (ෂිර්කුල් ජෙලියියු) පැහැදිලි ෂිර්ක්
- (ෂිර්කුල් කබියියු) වසංවූ ෂිර්ක්

*(නැතහොත් මෙයට අදාළ උදාහරණ තුනක් ලියා ඇත්නම් ලකුණු 03 යි)*

(iii) **ඊමාන් මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ ඇති කරන බලපෑම් පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.**

- අල්ලාහ් හැර වෙනත් දෙයකට නැමදුම් නොකිරීම / ප්‍රාර්ථනා නොකිරීම.
- ජය, පරාජය යන සියල්ල අල්ලාහ් වෙත භාර කිරීම.
- පින් කිරීමේ සිතැගියාව ඇති වීම.
- සියලු වහල් භාවයන්ගෙන් නිදහස් වීම.
- පරලොව ප්‍රශ්න විචාරණය සිදුවන බව විශ්වාස කර පවෙන් මිදී කටයුතු කිරීම.
- අල්ලාහ්ගේ තෘප්තිය ලබාගැනීමට.

*(මෙවැනි සුදුසු කරුණු 5 ක් ලියා ඇත්නම් 1 x 5 = ලකුණු 05 යි)*

*ලකුණු (2 + 3 + 5 = 10 යි)*

03.

(i) **තවාෆ් හි වර්ග දෙකක් නම් කරන්න.**

- තවාෆුල් කුදූම්
- තවාෆුල් ඉෆාලා
- තවාෆුල් විදා

*(මෙයින් දෙකක් ලියා ඇත්නම් ලකුණු 1 x 2 = 02)*

WWW.OLEVELAPI.COM

(ii) **හජ් මගින් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.**

- පාපයන් මැකී එදින උපන් දරුවකුගේ තත්ත්වයට පත් වීම.
- අල්ලාහ්ට යටහත් බව පෙන්නුම් කරයි.
- පරිත්‍යාගය, දේවබිය, කැප කිරීම, ඉවසීම යන ගුණාංග වර්ධනය වීම.
- තක්වා ඇති වීම.
- පරලොව දී ස්වර්ගය හිමි වීම.
- සහෝදරත්වය, සමානාත්මතාවය හා එකමුතුකම යනාදී ගුණාංග හිමි වීම.
- ඉස්ලාමීය ඉතිහාසය හා සම්බන්ධ ස්ථානවල සෘජු අත්දැකීම් ලැබීම. (බද්ර්, උහද්)

*(මෙවැනි ප්‍රයෝජන තුනක් සඳහන් කර ඇත්නම් ලකුණු 1 x 3 = 03)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii) හජ්වල වාජිබ් පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- නියමිත මීකාත් හි නියියත් තැබීම.
- දුල් හජ් දහවන දින (රාත්‍රියෙන් පසු) මුස්දලිෆාවෙහි රැඳීම.
- අයියාමුත් තෂ්රීක් හෙවත් දුල්හජ් 11, 12, 13 යන දිනවල රාත්‍රියේ මිනාවෙහි රැඳීම.
- දුල් හජ් දහවන දින ජම්රතුල් අකබාවෙහි ගල් 7 ක් විසි කිරීම.
- අයියාමුත් තෂ්රීක් දිනවල දී මධ්‍යහ්නයට පසු ජම්රතුල් අකබා, ජම්රතුල් උස්තා, ජම්රතුල් ඌලා යන ජම්රා තුනෙහි ම ගල් 7 බැගින් විසි කිරීම.
- තවාෆුල් විදා ඉටු කිරීම.

*(මෙයින් ඕනෑම කරුණු 5 ක් ලියා ඇත්නම් ලකුණු 1 x 5 = 05)*

*(2 + 3 + 5 = ලකුණු 10 යි)*

04.

(i) ෂියා, කවාරිජ් යන පදවල වෙනස පැහැදිලි කරන්න.

ෂීආ - කොටස, පක්ෂය, පාක්ෂිකයින්
නබි (සල්) තුමාට පසුව කිලාෆත් උරුමය හිමි විය යුත්තේ අලි (රලි) තුමාටය යන අදහස දරණ අය.

කවාරිජ් - වෙන් වී ගිය අය
සිෆ්ෆින් යුද සමයේ දී අලි (රලි) තුමාගේ සේනාවෙන් වෙන් වී ගිය අය.

*(කරුණු 2 ක් සඳහන් කර ඇත්නම් ලකුණු 1 x 2 = 02 යි)*

(ii) මක්කා ජයග්‍රහණයේ ප්‍රතිඵල තුනක් සපයන්න.

- මුස්ලිම්වරුන්ට ස්වකීය භූමියක පදිංචි වීමේ අවස්ථාව හිමි වීම.
- මුස්ලිම්වරුන්ට බියෙන් තොරව ජීවත්වීමේ වාතාවරණයක් ඇති වීම.
- ඉස්ලාමය ප්‍රබල ශක්තියක් බවට පත් වීම.
- කඃබාව ෂිර්ක්වලින් මුදවා ගැනීම.
- සමස්ථ මක්කාවම නබි (සල්) තුමාගේ පාලනයට නතු වීම.
- ඉස්ලාමයට ප්‍රවේශ වීමේ සංඛ්‍යාව වර්ධනය වීම.
- තමන්ට කෘෘර ලෙස සැලකූ අයට පොදු සමාව ලබාදීම.

*(මෙවැනි කරුණු 3 ක් ලියා ඇත්නම් ලකුණු 1 x 3 = 03 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iii) **තමාව දුෂ්ඨ ක්‍රියාවලින් වළක්වා ගැනීමට ඉස්ලාම් දහමට අනුව තරුණයෙක් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.**

- අධ්‍යාත්මික කටයුතු වල නිරත වීම.
  (දික්ර්, තව්බා, තිලාවතුල් කුර්ආන් වැනි)
- ඉස්ලාමීය මගපෙන්වීම් රැකගනිමින් ජීවත් වීම.
- කාමය සඳහා පොළඹවන ක්‍රියාවන්ගෙන් ඉවත් වීම.
- අජ්නබි - මහ්රම් යන සීමාව රැකගැනීම.
- ආගමික වදන්වලට සවන් දීම.
- නරක මිතුරු ඇසුරු වලින් වැළකී සිටීම.
- ආගමික පොත් පත් කියවීම.

*(මෙවැනි කරුණු 5 ක් කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් 1 x 5 = ලකුණු 05 යි)*
*(2 + 3 + 5 = ලකුණු 10 යි)*

05.

(i) **"දඃවා" යන පදයෙන් අදහස් කරන්නේ කුමක් ද?**

දඃවා යනු ඉස්ලාමය දෙසට ජනතාව කැඳවීමයි. *(ලකුණු 02 යි)*

(ii) **මක්කා සමයේ දඃවා කටයුතුවලදී නබි (සල්) තුමා මුහුණ දුන් අභියෝග තුනක් සඳහන් කරන්න.**

- සමාජයීය නායකත්වයේ දැඩි විරෝධතාවයට මුහුණ දීමට සිදුවීම. (අබු ජහ්ල්, අබුලහබ්)
- සතුරන්ගේ වාග් ප්‍රහාරවලට මුහුණ දීම. (හූනියම් කාරයා, බොරු කාරයා .......)
- ඉස්ලාමීය ප්‍රචාරණයට බාධා ඇතිවීම.
- නබි (සල්) තුමා ශාරීරිකව වද හිංසාවට ලක් කිරීම. (බෙල්ල හිර කිරීම, ඔටුවන්ගේ කුණු බඩවැල් දැමීම)
- ඉස්ලාමය වැළඳගත් අයට වදහිංසා පමුණුවීම.
- සමාජ සම්බාදකයට ලක් කිරීම (හි:බු අබු තාලිබ් හි වසර තුනක්)

*(මෙවැනි සුදුසු කරුණු තුනක් ලියා ඇත්නම් ලකුණු 1 x 3 = 03)*

(iii) **හිජ්රත් ගමනේ වැදගත්කම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.**

WWW.OLEVELAPI.COM

- ඉස්ලාමීය සමාජය බිහි කිරීම.
- ඉස්ලාමීය කිලාෆතයේ ආරම්භය.
- ඉස්ලාමීය ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස හිජ්රත් පැවතීම.
- ඉස්ලාමීය පාලනයේ ආරම්භය (අගනුවර, අණ පනත්, නීති රීති)
- සාමකාමී පරිසරයක් බිහි වීම. (අව්ස කස්රජ් සමගිය, යුදෙව්වන් සමග ගිවිසුම)
- කුරෛෂි කාෆිර්වරුන්ගේ කරදර වලින් නිදහස් වීම.
- ඉස්ලාමය බලවත් වීම.
- මස්ජිදුන් නබවි ඉදිකිරීම.

*(මෙවැනි සුදුසු කරුණු 5 ක් ලියා ඇත්නම් ලකුණු 1 x 5 = 05)*
*(මුළු ලකුණු 2 + 3 + 5 = ලකුණු 10 යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

06.

(i) **මහා පාපකර්මයන්ගෙන් හතරක් සඳහන් කරන්න.**

- අල්ලාහ්ට සමාන කිරීම.
- හූනියම් කිරීම.
- ඝාතනය කිරීම.
- පොලිය
- අනාථයින්ගේ දේපළ අත්පත් කිරීම.
- යුද පිටියෙන් ආපසු දිවීම.
- පවිත්‍ර වූ ස්ත්‍රීන්ට අවලාද නැගීම.

***(මෙයින් ඕනෑම කරුණු 4 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි)***

(ii) **බහුභාර්ය විවාහයට අනුමැතිය ලබාදීමට තුඩු දුන් හේතු තුනක් සඳහන් කරන්න.**

- අයතා ලිංගික ඇසුරින් ආරක්ෂාව ලැබීම.
- වැන්දඹුවන්ට රැකවරණය දීම.
- අනාථයින්ට රැකවරණය දීම.

***(මෙවැනි සුදුසු කරුණු 3 ක් ලියා ඇත්නම් 1 x 3 = 03)***

(iii) **ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ විශේෂාංග පහක් ගැන පැහැදිලි කරන්න.**

- දේව ගුණාංග.
- සමාජය තුළ පැන නගින ආර්ථික උස් පහත්කම් විධිමත් කිරීම.
- සමාජ යහපත සහ පෞද්ගලික යහපත අතර සම්බන්ධතාවයක් ඇති කිරීම.
- ආධ්‍යාත්මික අවශ්‍යතා සහ ලෞකික අවශ්‍යතා ගැන සමානව සැළකීම.
- කිසි කෙනෙකුට අසාධාරණයක් නොවීම.
- නම්‍යශීලීභාවය.

***(මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම් 1 x 5 = 05)***

***(මුළු ලකුණු 2 + 3 + 5 = ලකුණු 10 යි)***

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.

(i) **අල්-කුර්ආන් පහළ කිරීම**

- අල්කුර්ආනය ප්‍රථම වතාවට පහළ වූ සිද්ධිය.
- සූරා අලක් හි පළමු වාක්‍ය පහ පහළ වීම.
- පළමු වහී පහළ වී කෙටි කාලයකට පසු නැවත වහී පහළ වීම.
- "කුත්තාබුල් වහී" (වහී ලියන්නන්) නබි (සල්) තුමාගේ නිරීක්ෂණය යටතේ ලිවීම.
- වචන වශයෙන් ද සූරා වශයෙන් ද පහළ වීම.
- පහළ වූ පිළිවෙල ' තර්තීබුන් නුසූල් ' යනුවෙන් හැඳින්වීම.
- මක්කාවේත් මදීනාවේත් පහළ වීම.
- අවස්ථාවට උචිත ලෙස වසර 23 ක් පුරා පහළ විය.
- ප්‍රශ්නවලට පිළිතුරු ලෙස පහළ වීම.
- ගැටළුවලට විසඳුම් ලෙස පහළ වීම.

*(මෙවැනි කරුණු 5 ක් 1 x 5 = ලකුණු 05 යි)*

(ii) **කස්ර්-ජම්උ සලාතය**

- කස්ර් යනු සලාතය කෙටි කර ඉටු කිරීම වේ.
- ජම්උ යනු සලාත් වේල් දෙකක් එකතු කර ඉටු කිරීම වේ.
- මෙය ගමනක් යාමේදී සහනයක් ලෙස ලබාදී ඇති සලාත් ක්‍රමයකි.
- රක්ආත් හතරකින් යුක්ත සලාතය රක්ආත් දෙකක් ලෙස ඉටු කිරීම කස්ර් යනුවෙන් හඳුන්වමු. කස්ර් කළ හැක්කේ රක්ආත් හතරකින් යුක්ත සලාත් පමණි.
- ලුහර් සලාතය අස්ර් සලාතය සමග ද, මඃරිබ් සලාතය ඉෂා සලාතය සමග ද; ඉටු කළ හැකිය.
- ජම්උ සලාතය තක්දීම්, තඃහීර් යනුවෙන් කොටස් 2 කි.
- කස්ර් හා ජම්උ යනාදියෙන් අදහස් කෙරෙන්නේ කිසිදු අවස්ථාවකදී හෝ සලාතය අත හැරිය නොහැකිය යන්නය.

*(මෙවැනි කරුණු 5 ක් සම්බන්ධව කෙටි විස්තරයක් ලියා ඇත්නම් (ලකුණු 1 x 5 = 05 යි)*

WWW.OLEVELAPI.COM

(iii) **දේශය පිළිබඳ හැඟීම (දේශ ප්‍රේමය)**

- තමා ජීවත්වන රටට ආදරය කිරීම.
- නබි (සල්) තුමා හිජ්රත් යාමේදී තමා ජීවත් වූ මක්කාව කෙරෙහි දැක්වූ ආදරය වචන වලින් ප්‍රකාශ කළහ.
- රටට විශ්වාසව කටයුතු කිරීම.
- රටේ සමගියට දායකවීම.
- රට මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සෑම කෙනෙකුම දායක වීම.
- රටේ සිවිල් නීතියට ගරු කර කටයුතු කිරීම.
- සමාජ විරෝධී කටයුතුවලින් රට ආරක්ෂා කිරීම.

*(මෙවැනි කරුණු 5 ක් 1 x 5 = ලකුණු 05 යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv) **මස්ජිදුන් නබවී**

- මෙය මදීනාවෙහි පිහිටා ඇත.
- ඉස්ලාමීහි දෙවන පූජනීය ස්ථානය ලෙස පිළිගෙන ඇත.
- නබි (සල්) තුමන් විසින්, හිජ්රතයට පසු මෙය ඉදි කරන ලදී.
- නබි (සල්) තුමා විසින් ඉස්ලාමීය කිලාෆතය ආරම්භ කරන ලද්දේ මෙහි සිටය.
- මෙහිදී ඉටුකරනු ලබන සලාතයක් අනෙකුත් මස්ජිද්වල ඉටුකරනු ලබන සලාත් 1000 කට වඩා ශ්‍රේෂ්ඨ වේ.
- දේශපාලන, සමාජයීය සහ ආර්ථික කේන්ද්‍රස්ථානයක් ලෙස පැවතීම.
- වන්දනා ගමන් යාම සඳහා අවසර ලත් ස්ථාන අතරින් එකකි.
- මෙහි ආරම්භය සහ ව්‍යාප්තිය පිළිබඳ ඓතිහාසික පසුබිම.

*(මෙවැනි කරුණු 5 කට 1 x 5 = ලකුණු 05 යි)*

*(මුළු ලකුණු 5 + 5 = 10 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....